# දෙමළ අපේක්ෂා - III

පසුගිය ජූලි දහතුන්වැනිදා මේ තීරුවෙහි සඳහන් වූයේ චෙල්වනායගම් දෙමළ ජනතාවට දෙවැනි අපේක්ෂාවක් ලබාදුන් බව ය. දෙමළ ජනතාවගේ කෙසේ වෙතත් දෙමළ නායකයන්ගේ පළමුවැනි අපේක්ෂාව වූයේ මුළු ලංකාවේ ම නායකයන් වීම ය. එහෙත් ඒ අපේක්ෂාව බ්‍රිතාන්‍යයන්ගේ අනුග්‍රහයෙන් වුව ද ඉටුකර ගැනීමට නො හැකි විය. ව්‍යවස්ථාදායක සභාව පිහිටුවා අවුරුදු එකසිය විස්සකට පමණ පසුව, රාජ්‍ය මන්ත්‍රණ සභාවේ ඊනියා පනහට පනහ සටනින් පැරදීමෙන් ද පසුව, බොහෝ දෙමළ නායකයෝ සිංහල නායකයන් සමග එකට ක්‍රියාකිරීමට පටන්ගත්හ. ඩී . එස්. සේනානායක මහතාට 1946 දී ඇතැම් දෙමළ නායකයන් ද සමග එක්සත් ජාතික පක්ෂය පිහිටුවීමට හැකිවූයේ එබැවිනි. එහෙත් චෙල්වනායගම් එයට අකමැති විය. ඔහුට අවශ්‍ය වූයේ මුළු රටේ ම බැරි නම් අඩුම තරමින් උතුරු හා නැගෙනහිර පළාත්වල පාලකයා වීම ය. ඔහු ඒ සඳහා ඒ පළාත්වලට වෙන ම රාජ්‍යයක් ඉල්ලී ය. 1947 දී පමණ ඉලංකෙයි තමිල් අරසු කච්චි හෙවත් ලංකා දෙමළ රාජ්‍ය පක්ෂය පිහිටුවනු ලැබුයේ ඒ අරමුණින් ය. මේ පක්ෂය සිංහල ජනතාව රැවටීම සඳහා ඉංගිරිසියෙන් හා සිංහලෙන් ෆෙඩරල් පක්ෂය ලෙස නම් කෙරිණි. දෙමළ රාජ්‍යයක අවශ්‍යතාව දෙමළ නායකයන්ගේ පමණක් නොව දෙමළ ජනතාවගේ ද අපේක්ෂාවක් බවට පත්කිරීමට චෙල්වනායගම්ට අවශ්‍ය විය. එසේ නොමැතිව තම ඉල්ලීම දිනාගැනීමට නොහැකි බව ඔහුට අවබෝධ වන්නට ඇත.

1952 දී පැවති මහමැතිවරණයේ දී ශ්‍රී ල නි ප මෙන් ම දෙමළ රාජ්‍ය පක්ෂය ද පැරදිණි. එමෙන් ම 1956 දී ඒ පක්ෂ ඒ ඒ ප්‍රදේශවල ජයගත්තේ ය. ඇතැම් ඇංකරයන් කීමට තැත්කරන පරිදි මෙයින් කියැවෙන්නේ සිංහල ජාතිවාදය හා දෙමළ ජාතිකවාදය (ඔවුහු දෙමළ ජාතිවාදය යැයි නොකියති.) පනස් දෙකේ දී පැරදුණු බව හා පනස් හයේ දී ජයගත් බව නො වේ. මහාරාජා සමාගම සිල්ලර කඩ හා සිල්ලර ජඩමාධ්‍ය ඔස්සේ පිටරට නිපදවන ඇංකර් පිටි හා සංස්කෘතිය බෙදාහරින ආකාරයට කසිකබල් සම්මන්ත්‍රණ, වැඩමුළු හා ජඩමාධ්‍ය ඔස්සේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ දැනුම බෙදාහරින ඇංකරයෝ තම ස්වාමීන් කියන දේ හැරෙන්නට කුමක් දනිත් ද? සිංහල ජාතික බලවේග හා දෙමළ ජාතික බලවේග ක්‍රියාකරන්නේ දෙයාකාරයකට බව අපි කිහිප වතාවක් ම කියා ඇත්තෙමු. සිංහල දේශපාලනඥයන්ට ජාතික බලවේග පසුපස යැමට සිදුවෙයි. එහෙත් දෙමළ ජාතික බලවේග මෙහෙයවනු ලබන්නේ දෙමළ දේශපාලනඥයන් විසිනි.

පනස් දෙක වන විට ශ්‍රී ල නි ප සිංහල ජාතිකත්වයේ පක්ෂයක් බවට පත්ව නො තිබිණි. එහෙත් පනස් හයේ දී ඒ පක්ෂය සිංහල ජාතිකත්වයේ පක්ෂය බවට පත්ව සිටියේ ය. ඉන් පසු ජාතිකත්වයෙන් මුළුමනින් වියෝ වූ කිසිදු මාක්ස්වාදී පක්ෂයකට රටේ පිළිගැනීමක් නො වී ය. අද වන විට ජාතිකත්වයට එරෙහි (චිත්‍රපටි හා ටෙලිනාට්‍ය අධ්‍යක්ෂවරු හා නිද්පාදකවරු ද ඇතුළු) මාක්ස්වාදීහු වැඩිමවුහොත් ජනතාවට බාල විහිළු සපයන්නන් බවට පත් ව සිටිති. පනස් හයේ දී ශ්‍රී ල නි ප ප්‍රමුඛ ම එ පෙ ජයගත්තේ එය එකල ජාතිකත්වයේ පක්ෂය වූ බැවිනි. එමෙන් ම පනස් දෙකේ දී දෙමළ ජනතාව තම මතයට පක්ෂපාති කරගැනීමට ලංකා දෙමළ රාජ්‍ය පක්ෂයට නො හැකි විය. එහෙත් පනස් හයේ දී දෙමළ ජනයා යම් ප්‍රමාණයකට තම මතයට දිනාගැනීමට චෙල්වනායගම්ට හැකි විය. එහි දී ඔහු බොරුව මත පදනම් විය. සිංහලය රාජ්‍ය භාෂාව කිරීම වැරදි ආකාරයකින් අර්ථනිරූපණය කෙළේ ය. මෙරට ඉතිහාසයේ ඈත අතීතයේ සිට “රාජ්‍ය භාෂාව” වූයේ සිංහල ය. යාපනයේ ආර්ය චක්‍රවර්ති රජු හා පෘතුගීසීන් අතර ඇති වූ ගිවිසුම සකස්කර තිබුණේ ද සිංහල හා පෘතුගීසි බසින් ය. රාජ්‍ය භාෂාව යනු ආණ්ඩුව හා ජනතාව සම්බන්ධ කරන භාෂාව හෙවත් ආණ්ඩුවේ කාර්යාල හා ජනතාව අතර සන්නිවේදන භාෂාව යැයි ඔහු දෙමළ ජනයා නොමග යැවී ය. (වැඩි විස්තර සඳහා ප්‍රභාකරන් ඔහුගේ සීයලා බාප්පලා හා මස්සිනාලා කියවන්න)

ඒ අතර ඔහු බටහිරයන්ට අවශ්‍ය තවත් දෙයක් කෙළේ ය. ඔහු සිංහල බෞද්ධ විරෝධී පිරිස් ඇතිකර ඔවුන් ඒකරාශී කිරීමට උත්සාහ ගත්තේ ය. මේ සියල්ලෙහි දී ඔහු ක්‍රියා කෙළේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ නියෝජිතයකු ලෙස ය. මුල සිට ම බටහිරයෝ සිංහලත්වයට එරෙහිව දෙමළ ජාතිවාදය යොදාගත්හ. චෙල්වනායගම්ගේ උත්සාහයෙහි පියවර තුනක් විය. පළමුවෙන් ම ඔහු බොරු ප්‍රචාර මගින් දෙමළ ජනයා සිංහලයන්ට විරුද්ධව උසිගැන්වී ය. එහි දී ඔහු උතුරු හා නැගෙනහිර පළාත්වල ද උඩරට ද වාසය කරන දෙමළ ජනයා සිංහලයන්ට විරුද්ධව එකතු කිරීමට තැත් කෙළේ ය. ඔහු ආණ්ඩුව හැඳින්වූයේ සිංහල ආණ්ඩුව ලෙස ය. ඔහුගේ සටන ආණ්ඩු විරෝධී සටනකට වඩා

© Prof. Nalin De Silva

සිංහල විරෝධී සටනක් විය. මෙහි දී ඔහු උතුරු හා නැගෙනහිර පළාත්වල දෙමළ ජනයා එකතුකිරීම සම්බන්ධයෙන් නම් යම් සාර්ථකත්වයක් පෙන්නුම් කෙළේ ය. උතුරේ කුල පීඩනයෙන් බැට කෑ නැගෙනහිර දෙමළ ජනතාව උතුර සමග එකතුකිරීම ඔහු යම් පමණකට කෙළේ ය. එහි දී ඔහු තම සගයන් සමගින් බොරු ඉතිහාසයක් යොදාගත්තේ ය. දෙමළ ජනයාගේ ඉතිහාසය මුළුමනින් ම විකෘති කෙළේ ය. අබමල් පියල්ලක පමණවත් ඓතිහාසික තොරතුරු නැතිව සගයෝ දෙමළ ජනයා අනාදිමත් කාලයක් උතුරු හා නැගෙනහිර පළාත්වල ජීවත් වී යැයි කීවෝ ය.  උතුරේ දෙමළ ජනයාගේ ඉතිහාසය වසර තුන්සිය පනහකට සීමා වී ඇත. වෙන කිසිම සාධකයක් නොමැතිව වුවත් යාපනයේ කතාකරන දෙමළ හා තමිල්නාඩුවේ කතාකරන දෙමළ අතර වෙනස විශ්ලේෂණය කිරීමෙන් මේ කළ හැකි බව වාග් විද්‍යාඥයෝ දනිති. එහෙත් ඔවුහු ඒ බව ප්‍රසිද්ධියේ නො කියති. නැගෙනහිර දෙමළ ජනයාගේ ඉතිහාසය එයටත් වඩා කෙටි ය. උතුරේ හෝ නැගෙනහිර හෝ කිසි දිනෙක නොතිබූ දෙමළ රාජ්‍යයක් උතුරේ හා නැගෙනහිර ඒකාබද්ධව තිබූ බවක් අඟවමින් ඔහු දෙමළ ජනයා එකතු කෙළේ ය. ඔහු කීමට අමතක කළ දෙය නම් උතුරු හා නැගෙනහිර පළාත් එලෙස වෙන්කර පළාත් බවට පත්කරනු ලැබුයේ බ්‍රිතානීන් විසින් 1889 දී තරම් මෑතක බව ය!  මේ මිථ්‍යාව දැන් පුපුරා ගොස් ය. නැගෙනහිර පළාතේ දෙමළ ජනයා උතුරු පළාතෙන් හා ප්‍රභාකරන්ගෙන් වෙන්වීමට තීරණය කර ඇත්තේ යා දෙක නොරත රත සමග පෑහීමක් නැත යන්න සිහි ගන්වමිනි.

දෙවැනි පියවරේ දී ඔහු උතුරු හා නැගෙනහිර මුස්ලිම් ජනයා එකතු කිරීමට උත්සාහ කෙළේ ය. දෙමළ කතාකරන ජනයා යන පදනම එහි දී යොදාගනු ලැබිණි. එය ද යම් ප්‍රමාණයකට සාර්ථක විණි. 1976 වඩුකොඩේ සම්මේලනය මේ සිංහල බෞද්ධ විරෝධී එකතුවේ සන්ධිස්ථානයක් විය. උතුරු හා නැගෙනහිර පළාත්වලට වෙන ම රාජ්‍යයක් යන යෝජනාව එහි දී සම්මත කරගනු ලැබිණි. පසුගිය තිස්වසරක පමණ කාලයක් තිස්සේ කෙරී ගෙන යන ඝාතනවලට ප්‍රභාකරන්ට ද වඩා වගකිව යුතු වන්නේ චෙල්වනායගම් ය. ප්‍රභාකරන් පණපිටින් අසුවුවහොත් අතීතයට බලපාන පරිදි දෙතිස් වධ නීතියක් සම්මත කර ඔහුට ඒ දඬුවම් සහිතව මරණ දඬුවම නියම කළ යුතු ය. එහෙත් මියගිය චෙල්වනායගම්ට දෙන්නේ කිනම් දඬුවමක් ද? ව්‍යාජ ගාන්ධි ප්‍රතිරූපයක් මවාගෙන ජනතාව හිංසනයට යොමු කළ චෙල්වනායගම්ගේ නාමයට කළහැකි වැඩිම අපකීර්තිය කුමක් ද යන්න සොයා බැලිය යුතු ය. සාන්තුවරයකු ලෙස පෙනී සිටිය ඔහු පැහැදිලිව ම ඝාතනයේ පියා විය.

දකුණු ඉන්දීය දෙමළ පල්ලියේ සාමාජිකයකු වූ චෙල්වනායගම්ට සිංහල බෞද්ධ විරෝධයක් තිබී ඇති බව පැහැදිලි ය. තුන්වැනි පියවරේ දී ඔහු සිංහල බෞද්ධයනට එරෙහිව ඒ වන විටත් ක්‍රියාත්මක ව සිටි ප්‍රභූ කිතුණුවන් සමග එකතු විය. එසේත් නැතහොත් ඒ කිතුණු ප්‍රභූවරු සිංහල බෞද්ධයනට විරුද්ධව දෙමළ ජාතිවාදය යොදාගැනීම වඩාත් ප්‍රසිද්ධියේ කළහ. දෙමළ ජාතිවාදයේ ඇත්තේ සිංහල විරෝධයකට ද වඩා බෞද්ධ විරෝධයකි. බොහෝ දෙමළ ජනයාට ඒ පිළිබඳ අවබෝධයක් ඇතැයි සිතිය නො හැකි ය. මතුපිටින් ගත්කල දෙමළ ජනයාට පෙන්නුම් කෙළේ සිංහලයන්ගේ ඊනියා අසාධාරණකම් හමුවේ තම ඊනියා නිජභූමියේ වෙන ම රාජ්‍යයක් සඳහා ඔවුන්ට සටන්කිරීමට සිදු වී ඇති බව ය. එහෙත් සිදු වූයේ සිංහල බෞද්ධ සංස්කෘතිය දුර්වල කිරීම (හැකිනම් නැතිකිරීම) හා සිංහල බෞද්ධ සංස්කෘතියට මෙරට හිමි තැන අහිමි කිරීම ය. මහාරාජාලා ද චෙල්වනායගම්ලා ද රායප්පු ජෝසප් ආදී පූජකවරු ද රාජ්‍ය නොවන නඩය ද නොර්වේ ආදී බටහිර රටවල් ද, බටහිර කසිකබල් උගතුන් ද, ඔවුන් අනුකරණය කරන මෙරට පිටකොන්ද නැති කෙරුණු ඊනියා උගතුන් ද, ක්‍රිස්තියානි හා කතෝලික පල්ලිවල ඇතැම් පූජකවරු හා ඇතැම් ප්‍රභූවරුන් ද උත්සාහ ගන්නේ ඒ කිරීමට ය. පසුගිය කාලයේ ඇතැම් ප්‍රධාන කතෝලික හා ක්‍රිස්තියානි පූජකවරුන් හා ප්‍රභූවරුන් තමන් එතෙක් විඳි වරප්‍රසාද නැතිවී යනු වැළැක්වීම සඳහා සිංහල බෞද්ධයන්ට එරෙහිව දෙමළ ජාතිවාදය යොදාගෙන ඇති බව තවදුරටත් රහසක් විය නො හැකි ය. මොවුන් අතර සිටින තිස්ස බාලසූරිය, රොහාන් සිල්වා යන පූජකවරු හා ජෙහාන් පෙරේරා කොටින්ගේ ඒකපාක්ෂික සටන්විරාමයකට මුවා වී ඊනියා සටන්විරාමයක් සඳහා පෙත්සම් අත්සන් කරති.  සාමාන්‍ය සිංහල කිතුණුවන් සිංහල බෞද්ධයන් සමග සහජීවනයෙන් කටයුතු කරද්දී මේ නායකයෝ හීන් නූලෙන් සිංහලත්වයට විරුද්ධව ක්‍රියා කරති. දැන් කලක සිට නායක පූජකවරු සර්ව ආගමික කැරොල් කරත්තයක් දක්කති. එයට භික්ෂූන් වහන්සේ එකතුකරගෙන ඇත්තේ කිනම් පදනමකින් ද? සමස්ත භික්ෂූන් වහන්සේ නියෝජනය කිරීමට කිහිප නමක් පමණක් තෝරාගත්තේ කවු ද? කෙසේ ද? මේ තෝරාගෙන ඇත්තේ යම් යම් හේතු නිසා තමනට අවනත වීමට සිදු වී ඇති භික්ෂූන් වහන්සේ ද? කරත්තය දක්කන්නේ කිනම් දිශාවකට ද?

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva